
## බස - රස - දෙස - සසුන එකලු කළ වජිරාරාමය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශාධිපති
මහාචාර්ය සඳගෝමි කෝපරහේවා





ලොව පුරා බුදු දහම ප්‍රචාරය කළ ධර්ම දූතයන් ද සුමධුර දහම් දෙසුමෙන් බුදුනු සිත් පහන් කළ ධර්ම දේශකයන් ද දහම් පතපොත ලිවීමෙන් සදහම් මඟ හෙළි පෙහෙළි කර දුන් ධර්ම ග්‍රන්ථ කර්තෘන් ද දහම් දැනුම ලබා දුන් දහම් පාසලක් ද දහම් පතපොත රැස් කොට තැබූ මහාර්ඝ පුස්තකාලයක් ද බෞද්ධ ලෝකයාට දායාද කළ බම්බලපිටියේ වජිරාරාමය, දෙස් විදෙස් බෞද්ධයන්ගේ ගෞරවයට පාත්‍ර වී ඇති සියවසකට වඩා පැරණි පූජනීය විහාරස්ථානයකි. මේ අනුව විසිවන සියවසේ මෙරට බෞද්ධ පුනර්ජීවනයට හා ධර්ම ශාස්ත්‍රීය ප්‍රගමනයට පුරෝගාමී වූ විහාරස්ථානයක් වශයෙන් ද වජිරාරාමයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි.

බම්බලපිටියේ සිරි වජිරාරාමයේ ධර්ම ශාස්ත්‍රීය මෙහෙවර ආරම්භ වන්නේ 1890 දී පමණ ප්‍රදේශවාසි බෞද්ධ ප්‍රභූන් කීප දෙනකු ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා පැවැත්වීම සඳහා ‘ධර්ම සමාගම’ නමින් සමිතියක් පිහිටුවා ඉන්පසුව 1898 දී ‘ධර්ම ශාලාව’ක් සාදා ගෙන නොයෙක් පින්කම් කිරීමත් සමඟ ය. එවකට වැලි පාර නමින් හැඳින්වූ වජිර පාරේ පිහිටි මේ ධර්ම ශාලාව සෑදීම සඳහා අවට ගම්වාසී බෞද්ධයන් වෙරළේ සිට කරින් වැලි ගෙන ආ බව පැරන්නෝ කියති. 1901 ජූලි මස 27 වන දා බම්බලපිටියේ අද සිරි වජිරාරාමය පිහිටි බිමේ මේ ධර්ම ශාලාව ස්ථිර ලෙස පිහිටුවීමෙන් පසුව එහි නිත්‍ය වාසය සඳහා ආරාධනා කරනු ලැබුවේ එවකට විද්‍යෝදය පිරිවෙනේ අධ්‍යාපනය නිම කොට වැල්ලවත්තේ සුවිශුද්ධාරාමයේ වැඩ සිටි තුරුණු වියේ සිටි සිල්වත්, නැණවත් යතිවරයාණන් කෙනෙකු වූ පැළෑණේ සිරි වජිරඤාණ හිමිපාණන්ට ය. එම ධර්ම ශාලාවේ කුඩා අසපුවක් තම ආශ්‍රමය කර ගෙන දායකයන්ගේ ද හිතවතුන්ගේ ද ආධාරයෙන් එම ස්ථානය දියුණුවට පත් කළ පැළෑණේ හිමියන් නිසා එයට ‘වජිරාරාමය’ යන නම ලැබිණ. එක ම ශාලාවකට පමණක් සීමා වී තිබූ වජිරාරාමය උන් වහන්සේ නිසා ලෝක ප්‍රසිද්ධ බෞද්ධ විහාරයක් බවට පත් විය. වජිරාරාමය නිසා යාබද ව පිහිටි මාර්ගය ‘ වජිර පාර’ ලෙසත් ප්‍රසිද්ධියට පත් විය.

ධර්ම ශාලාවක් ලෙස පැවති මේ ස්ථානය, ඉතා කෙටි කලෙකින් බම්බලපිටියේ වජිරාරාමය ලෙස ලක්දිව විහාරස්ථාන අතර ප්‍රමුඛස්ථානයකට පත් වූයේ පැළෑණේ සිරි වජිරඤාණ හිමිපාණන් කෙරේ බෞද්ධ ජනයා මෙන්ම ගිහි - පැවිදි උගතුන් දැක්වූ මහත් ගෞරවය නිසා ය. දකුණු පළාතේ වුසු ප්‍රකට සිංහල පඬිරුවනක් වූ 'තුඩාවේ පඬිතුමා' නමින් ප්‍රකට වූ දොන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම්ගේ කනිටු පුත් රුවනක් වූ මුන් වහන්සේ විද්‍යෝදය පිරිවෙනින් ධර්ම ශාස්ත්‍ර හදාරා එහි විශිෂ්ටතම ශිෂ්‍යයාට හිමි වන ශ්‍යාමරාජ ත්‍යාගය ද දිනා ගනිමින් තුරුණු අවදියේ සිට ම භාෂා සාහිත්‍යය හා ධර්ම ශාස්ත්‍ර විශාරදත්වය පළ කළ යතිවරයාණ කෙනෙකි. අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ මහානායක පදවිය දැරූ පැළෑණේ මහ නා හිමියෝ, වජිරාරාම ගණයේ භික්ෂූන් ජීවත් විය යුතු ආකාරය හා ක්‍රියා කළ යුතු ආකාරයත් වජිරාරාමයේ ශාඛා විහාරාරාම පාලනය විය යුතු අන්දමත් පැහැදිලි කරමින් වජිරාරාම කතිකාවතක් ද පිළියෙල කළහ. විසිවන සියවසේ කොළඹ නගරයේ පන්සල කේන්ද්‍ර කර ගත් ධර්ම ශාස්ත්‍රීය හා සමාජීය මෙහෙවරට පුරෝගාමී වූ යතිවරයකු වූ පැළෑණේ හිමියෝ, ස්වකීය විහාරස්ථානය ශාසනික හා ජාතික වැදගත්කමින් යුක්ත පූජා භූමියක් බවට පත් කරන්නට කටයුතු කළහ.

**1918** අගෝස්තු මස දී පැළෑණේ නා හිමිපාණන්ගේ මහ පෙන්වීම යටතේ ආරම්භ වූ වජිරාරාම දහම් පාසල අවට ප්‍රදේශවලින් පමණක් නොව සෙසු පෙදෙස්වල බුදුනු දරුවන්ගේත් දහම් දැනුම වර්ධනය කළ ආයතනයකි. වජිරාරාම දහම් පාසලින් දහම් පන්නරය හා අධ්‍යාපනය ලැබූ සිසු දරුවෝ දහස් ගණනක් වෙති. බම්බලපිටියේ වජිරාරාමයේ ප්‍රකාශනයක් ලෙස **1936** දී ඇරඹුණු ' බෞද්ධ ළමයා' නමැති සදහම් සඟරාව ළමයින්ට පමණක් නොව වැඩිහිටියන්ට ද ප්‍රයෝජනවත් වූ සාරවත් ලිපිවලින් යුක්ත අගනා මාසික සඟරාවක් විය. එම සඟරාව මුලින් ම සකස් කරන ලද්දේ වජිරාරාමවාසීව වැඩ වුසූ පඹුරන මෙත්තෙය්‍ය හිමියන් විසිනි. ගිහි අවදියේ දී ( චාල්ස් අභයගුණරත්න) ලේක්හවුස් ආයතනයට බැඳී දිනමිණ කතු මඬුල්ලේ සේවය කළ මෙතුමා **1934** දී මුල් වරට නිකුත් වූ දිනමිණ වෙසක් කලාපයේ සංස්කාරකවරයා ද විය. මේ අනුව මෙරට නාගරික සමාජයේ බුදුනු දරුවන්ට සදහම් දැනුම හා පුහුණුව ලබා ගැනීමට වජිරාරාම දහම් පාසලත්, 'බෞද්ධ ළමයා' සඟරාවත් ඉංග්‍රීසියෙන් පළ වූ බෝසත් ( ඔයැ ර්දීඑ* නම් සඟරාවත් 'ලක්බුදු සසුන' නම් බෞද්ධ පත්‍රයත් සැලසූ මෙහෙවර ඉතා පතළ ය. රටක මතු දියුණුව දරුවන් අත බව සැලකූ පැළෑණේ මහ නා හිමියෝල ඔවුන් යහ මග යවනු සඳහා කවි-ගී දහස් ගණනක් ලියූහ. පහත දැක්වෙන්නේ 'බෞද්ධ ළමයා' සදහම් සඟරාවේ එබඳු පැබඳුම් කීපයකි.

තරයේ වැර වඩවු - නො නැවත ඉදිරියට යවු
පසුබට නොවී මදකුත් - දියුණුව පතන ළමයිනි

දරුවෙනි කිසි කලෙකැ - දුටු දුටු දෙයට නො හඬවු
ලද දෙයෙකින් ම සතුටු වැ - දෙගුරුන් සිත් සනස්වවු

දෙන විට මවුපියන් - යම්තම් සුළු දෙයක් වත්
හරසර කැර හිස නමා - දැතින් ම පිළිගන්නේ

විසිවන සියවසේ දී ගුවන් විදුලි ධර්ම දේශනා සම්ප්‍රදාය ආරම්භ කිරීමේ ගෞරවය හිමි වන්නේ ද බම්බලපිටියේ වජිරාරාමයට ය. 1928 අප්‍රේල් 28 දින ගුවන් විදුලියේ ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූ පැළැණේ මහ නා හිමියෝ්ල යම්කිසි මැයකට අනුව පැයක පමණ ධර්ම දේශනාවක් කිරීමේ සම්ප්‍රදාය හඳුන්වා දුන්හ. " පැළැණේට නම් බණ කීමේ පැලැන අසූ වී තිබෙනවා" යයි වරක් ප්‍රකාශ කොට ඇත්තේ විද්‍යෝදය පරිවේණාධිපති ධුරය හෙබවූ මහගොඩ ශ්‍රී ඥානේශ්වර හිමියන් ය. එම ගුවන් විදුලි ධර්ම දේශනා මගින් මෙරට ධර්ම සන්නිවේදනයේ නව සම්ප්‍රදායක් ඇති වූ අතර වජිරාරාමයේ වැඩ සිටි නාරද හිමි, පියදස්සි හිමි ආදීන්ගේ සුමධුර ධර්ම දේශනා නිසා ලක්වැසි බුදුනුවන්ගේ සිත් සතන් පහන් විය.

දම් දෙසුම් පැවැත්වීමෙන්, පතපොත ලිවීමෙන් පමණක් නොව පතපොත රැස් කිරීමේ යෙදුණු උගත් යතිවරයන් වහන්සේලා විසූ පින් බිමක් වශයෙන් ද වජිරාරාමය සැලකුම් ලබයි. ගුණවත්කමල සිල්වත්කම, තැන්පත් බව හා නැණවත්කම යනාදී ගුණයෙන් සපිරුණු කහ සිවුරක කැටි වුණු උත්තරීතරභාවය ආරක්ෂා කළ සඟ පරපුරක් ඇති කළ සංඝ පිතෘවරයකු වශයෙන් ද පැළැණේ හිමියන්ට ලැබෙන්නේ ඉහළ ම තැනකි. උන් වහන්සේගේ පැවිදි සිසුන් අතරට ගැනෙන නාරද හිමි, කඹුරුගමුවේ මහානාම හිමි, දෙණිපිටියේ සුමනසිරි හිමි, මඩිහේ පඤ්ඤාසීහ හිමි, පියදස්සී හිමි, අම්පිටියේ රාහුල හිමි, පඹුරන මෙත්තෙය්‍ය හිමි, ඛෙමින්ද හිමි, පන්විල විපස්සි හිමි, ඌරුගමුවේ සේනානන්ද හිමි, වල්ගම සුගතනන්ද හිමි, සෝම හිමි, ඛෙමින්ද හිමි, නාඔටුන්නේ ගුණසිරි හිමි, බම්බලපිටියේ කස්සප හිමි, ඉංග්‍රීසි ජාතික ඥාණවීර හිමි, ඥාණමෝලි හිමි ආදීහු වජිරාරාම සඟ පරපුර බැබළවූ යතිවරු වූහ. මේ ශිෂ්‍ය පිරිසට අමතරව මහ නාහිමියන්ගේ ධර්මාන්තේවාසීව වජිරාරාමයෙහි වැඩ වුසූ භික්ෂු පිරිස අතර පණ්ඩිත වැලිගම ඥාණරතන හිමි ආදී පැවිදි උතුමන් සංඛ්‍යාව ද ඉමහත් ය. බස - රැස - දෙසට හා සසුනට ලැදිව කටයුතු කළ පැළැණේ මහ නා හිමියන් ප්‍රමුඛ මේ යතිවරුන් නිසා ලක් බුදු සසුනේ නව සම්ප්‍රදායක් ඇති වූ අතර එය 'වජිරාරාම සම්ප්‍රදාය' ලෙස විද්වතුන්ගේ අවධානයට ද ලක් වී ඇත. වජිරාරාම සම්ප්‍රදාය රැක ගෙන එහි පැවැත්ම සහ දියුණුව උදෙසා කටයුතු කරන්නට පැළැණේ මහ නා හිමියන්ගේ සිසු පිරිස කටයුතු කළහ.

බුදු දහම ගැන පමණක් නොව භාෂා සාහිත්‍යය පිළිබඳව ද නවීන මත ඇසෙන්නට වූයේ වජිරාරාමයේ වැඩ සිටි මේ සඟ පරපුර නිසා ය. විසිවන සියවස මුල් දශකවල පළ වූ පුවත්පත් සඟරා, වෙසක් කලාප ආදියේ සංස්කාරකවරුන් පැළැණේ මහ නා හිමියන්ගෙන් සාරවත් වූ ව්‍යක්ත වූ කාලෝචිත වූ ලිපියක් ලබා ගැනීම සිරිතක් විය. නිසි ලෙස පද බෙදා නිවැරදි සිංහල වහරට මුල් තැන දෙමින් ගැදි - පැදි පැබඳුම් ලියූ යතිවරුන් අතර පැළැණේ මහ නා හිමියෝ මුල් තැනක් ගනිති. " වජිරඤාණ නායක හිමියන් ලියූ

හැම ධර්ම ලිපියක් ම ඔප මට්ටම් කිරීමෙන් නිම කළ ප්‍රතිමා'' වැනි යයි පවසන මාර්ටින් වික්‍රමසිංහ සූරීන් උන් වහන්සේගේ භාෂා රීතිය පිළිබඳව මෙසේ කරුණු දක්වා ඇත.

> සද්ධර්මත්නාවලිය ලියූ ධර්මසේන හිමියන්ට මෙන් වජිරඤාණ නායක හිමියන්ට ද තමන්ට ම හිමි රීතියක් වීය. උන් වහ්නසේගේ කවර ලිපියක් වුව ද පාඨකයා වහා හඳුනා ගන්නේ ඒ රීතිය නිසා ය. උන් වහන්සේගේ ඒ රීතිය වූකලී පැරණි ගද්‍ය රීතිය, ශ්‍රව්‍ය කාව්‍ය රීතිය, තැන්පත් නුවණ, බුදු දහමෙහි පැතිරි නුවණ, චතුරතාව, තර්කානුකූලව සිතීම, සිතා හැඟීම, උත්ප්‍රාසය යන මේ සියල්ලෙහි සංකලනයෙන් ඉපිද සකස් වූවකි යි මම සිතමි ( අපේ උරුමය හා භික්ෂූන් වහන්සේ, 87 පිටුව).

ගැදියෙන් මෙන්ම පැදියෙන් ද රචනා සැපයීමට පැළෑණේ මහ නා හිමියන් දැක්වූ සමත්කම් ප්‍රකට ය. එකල සැම පුන් පොහෝ දිනක ම වජිරාරාමයෙන් පළ වූ 'බෞද්ධ ළමයා' සදහම් සඟරාවේ පැළෑණේ මහ නා හිමියන්ගේ පැදි පෙළක් පළ වී ඇත. පහත දැක්වෙන්නේ බුදු වසින් 2488 (1944) පොසොන් පොහොය නිමිත්තෙන් 'බෞද්ධ ළමයා' සඟරාවේ පළ වූවකි.

> හෙළදිව්හි මැ උපන්
> නොමුසු හෙළ පෙළපත් ඇති
> හෙළ දෙමාපියනට දා
> පිරිසිදු අරී හෙළයකු,
>
> හෙළදිව්හි මැ වැඩි
> පැවිදි වැ ඉගෙන තෙවළා
> හෙළ පිරිස් මැදැ එළුයෙන්
> හෙළි කොටැ බණ වදාළොත්
>
> එකල්හි මැ හෙළදිවැ
> සසුන් මුල් බස්නේ යැ යි
> වදහළ මිහිඳු හිමියන්
> වදිමු මෙ පොසොන් පොහො දා

එසේ ම සරල බසින් දහම් කරුණු හෙළි පෙහෙළි කිරීමට පඹුරන මෙත්තෙය්‍ය හිමි, නාරද හිමි, පියදස්සී හිමි වැනි යතිවරුන් දැරූ ප්‍රයත්නය නිසා දහම් දැනුම ප්‍රචාරයට සුදුසු බස් වහරක් ද සකස් විය. පැළෑණේ මහ නා හිමියන්ගෙන් ලැබුණු විශේෂ උපකාර සහිත නාරද හිමියන් විසින් රචනා කරන ලද 'සදහම් මඟ' පොත් පෙළ හා 'ධර්ම සංග්‍රහය' මේ රටේ පාසල්වල බොහෝ කාලයක් මුළුල්ලේ බුද්ධාගම ඉගැන්වීම සඳහා භාවිතයේ පැවැතිණ. පොතපතින් පමණක් ධර්මය ඉගෙනීම ප්‍රමාණවත් නොවන බව නාරද හිමියෝ අවධාරණය කරති.

ධර්මය හදාරන්නේ ධර්මානුකූලව පිළිපැදීමට ය. ප්‍රතිපත්තියෙන් තොර වූ ධර්ම ඥානයෙන් වැඩක් නැත. එහෙයින් පතපොතට සීමා වූ දහම් දැනුමෙකින් බෞද්ධ ශිෂ්‍යයා තෘප්තිමත් නොවිය යුතු ය. උත්කෘෂ්ට සංස්කෘතික දායාදයක් උරුම කොට ඇති ඔහු, ඔහුගේ හැදූම, වැඩුම, දැනුම ඔප නැගීමට හේතු වූ බෞද්ධ ප්‍රතිපත්ති පුරුදු පුහුණු කළ යුතු ය (ධර්ම සංග්‍රහය, ix).

ඉතා ගැඹුරු දහම් කරුණු පවා ඉතා පැහැදිලිව දරුවන්ට කියා දීමට එම යතිවරුන්ට හැකියාව ලැබුණේ ඔවුන් සතුව පැවැති ධර්ම ඥානය මෙන්ම ඉතා හොඳින් සිංහල භාෂාව භාවිත කිරීම සඳහා දියුණු කර ගත් භාෂා ඥානය නිසා ය. මේ නිසා දහම් දැනුමින් හා හැදියාවෙන් පිරිපුන් බස - රස - දෙසට ගරු කරන බුදුනු දරු පිරිසක් ඇති වූහ.

බෞද්ධ පඬිවරුන් රැසකගේ නිවහන වූ වජිරාරාමය සතුව ඇති පුස්තකාලය ද මෙරට පන්සල් පොත්ගුල් අතර වැදගත් වේ. සිංහල, පාලි, සංස්කෘත, බුරුම බසින් ලියැවුණු ධර්ම ග්‍රන්ථ, සිංහල භාෂා සාහිත්‍ය විෂයක ග්‍රන්ථ, ඉංග්‍රීසි දහම් පතපොත මෙන්ම ඉතා දුර්ලභ පුස්කොළ පොත් එකතුවකින් ද මේ පුස්තකාලය සමන්විත වෙයි. 1924 ජූලි මස 15 වන දා පැළෑණේ වජිරඤාණ හිමිපාණන්ගේ ඇරයුමින් එකල යටත් විජිත ලේකම්වරයා වූ සිසිල් ක්ලේමන්ටි මහතා විසින් විවෘත කරන ලද වජිරාරාම පුස්තකාලය සමකාලීන ගිහි - පැවිදි උගතුන්ගේ ද අවධානයට ලක් වූ විශිෂ්ට ගණයේ පුස්තකාලයක් විය. එකල සිංහල මෙන්ම ඉංග්‍රීසි පුවත්පත්වල මේ පුස්තකාලය විවෘත කිරීමට විශාල ප්‍රචාරයක් ලබා දී ඇත්තේ එය " කොළඹ නගරයට අගනා පරිත්‍යාගයක්" ලෙස හඳුන්වාදෙමිනි. එම පුස්තකාලය හා යාබදව පිහිටි ආවාස සහිත ගොඩනැගිලි ඉදි කොට සසුනට පුදන ලද්දේ බම්බලපිටියේ වුසූ ජී.ජේ. සිල්වා මහතා සහ එම මහත්මිය විසිනි. ආරම්භයේ දී ග්‍රන්ථ 200කින් පමණ ආරම්භ වුවත් ඉතා කෙටි කලකින් උසස් මට්ටමක ප්‍රාචීන පුස්තකාලයක් ලෙස වජිරාරාම පුස්තකාලය වර්ධනය වූයේ ය. විසිවන සියවස මුල් දශකවල දී පතපොත පළ කළ පොත් සමාගම් හා මුද්‍රණාල තම දහම් පොත්වලින් පිටපතක් වජිරාරාමයට එවීම පුරුද්දක් කර ගෙන ඇති අතර එසේ ම ඇතැම් ධර්ම ග්‍රන්ථ හා සඟරාදිය ප්‍රකට පොත් වෙළෙඳුන්ගෙන් ලබා ගෙන පිළිවෙළින් රැස් කොට තබා ගන්නට පැළෑණේ මහ නා හිමියෝ මූලිකත්වය ගත්හ. මේ නිසා කොළඹ නගරයේ පිහිටි මාහැඟි ධර්ම පුස්තකාලයක් ලෙස වජිරාරාම පුස්තකාලය දෙස් - විදෙස්හි පතළ වන්නට වූ අතර එය පරිශීලනය කිරීමට බොහෝ විද්වත්හු පැමිණියහ. වර්තමානයේ දී පවා බුදු දහම හා ප්‍රාචීන භාෂා විෂයක වැඩිදුර ඉගෙනීමක් සිදු කරන පර්යේෂකයකුට වජිරාරාම පුස්තකාලය ඇසුරු කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන අප්‍රමාණ ය.

පැළෑණේ මහ නා හිමියන් සමකාලීන වියතුන් අතර සම්භාවනාවට පාත්‍ර වූයේ 'පෙරදිග මහා ධර්ම භාණ්ඩාගාරය' ලෙසිනි. එකල ධර්ම විනය ප්‍රශ්නයක් පැන නැඟුණා නම් ගිහි -පැවිදි උගතුන් බලාපොරොත්තු වූයේ පැළෑණේ මාහිමියන්ගේ විසඳුම යි. "ලක්දිව ගිහි - පැවිදි කවර විශාරද කෙනෙකු වුව ද භාෂාන්තර ගැටලුවක් ගැන හෝ වේවයි - සමයාන්තර ගැටලුවක් ගැන වේව යි - පෞද්ගලික උපදේශයක් ගැන වේව යි පළමු කොට ම පිය නැඟුවේ වජිරාරාමය දෙසට" බව 'ශ්‍රී වජ්‍රඥාන චරිතය' රචනා කළ

ඩේවිඩ් කරුණාරත්න සූරීන් සඳහන් කර ඇත. මේ නිසා එකල සිටි උගතුන් පමණක් නොව ජන නායකයන් ද විවේක ලද හැම විටෙක ම වජිරාරාමයට පැමිණ නොයෙක් ධර්ම ශාස්ත්‍රීය කාරණා දැන ගැනීමත් අවවාද අනුශාසනා ලබා ගැනීමත් පුරුද්දක් කර ගෙන තිබිණ. සමකාලීන පැවිදි පඬිවරුන් පමණක් නොව ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, කුමාරතුංග මුනිදාස, මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ල්යු. ඒ.සිල්වා, පීටර් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන (පැළෑණේ මහ නා හිමියන්ගේ සොහොයුරෙකි), ප්‍රකට කවියකු හා ග්‍රන්ථ කර්තෘවරයකු වූ කටුනායක ලයනල් ඩබ්ලිව් ද සිල්වා, මහාචාර්ය ගුණපාල මලලසේකර, පුවත්පත් කතුවරයකු හා ප්‍රකට ලේඛකයකු වූ ඩේවිඩ් කරුණාරත්න වැනි උගතුන් රැසක් ම පැළෑණේ මහ නා හිමියන් ප්‍රමුඛ වජිරාරාම භික්ෂූන් වහන්සේලා හා එහි පුස්තකාලය ඇසුරින් තම ධර්ම ශාස්ත්‍රීය කරුණු හෙළි පෙහෙළි කර ගෙන ඇත. විශේෂයෙන් ම තුරුණු වියේ දී වජිරාරමයට පැමිණ පැළෑණේ වජිරඥාණ හිමිපාණන් වෙතින් සිංහල, පාලි, සංස්කෘත පිළිබඳ උසස් දැනුමක් ලබා ගැනීමට නවකතා කතුවර ඩබ්ල්යු. ඒ.සිල්වා සාහිත්‍යවේදියා දැරූ ප්‍රයත්නය ඉතා ප්‍රකට ය. එතුමා විසින් ආරම්භ කරන ලද 'සිරිසර' නම් සඟරාවට 'යතලබ කිවියර' නමින් ලිපි, කවි,ගී හා සිලෝ රැසක් සපයන ලද්දේ පැළෑණේ මාහිමියන් විසිනි. එසේ ම මෙරට බෞද්ධ අධ්‍යාපනයේ මෙන් ම උසස් අධ්‍යාපනයේ පුරෝගාමියකු වන ලංකා විශ්වවිද්‍යාලයේ පාලි භාෂාව පිළිබඳ මහාචාර්යවරකු වූ ගුණපාල මලලසේකර සූරීන් පැළෑණේ මහ නා හිමි ඇසුර පිළිබඳව මෙසේ සඳහන් කර ඇත.

> සමකාලීනයන් අතර කථා සල්ලාපයෙහි උන් වහන්සේට සරි කළ හැකි අන්‍යයකු සිටි බවක් නොදනිමි. එහෙත් හැම විට ම උන් වහන්සේ කථා කළේ දෙලෝ වැඩදායී කරුණු ගැන පමණයි ... උන් වහන්සේ පළමුවෙන් දුටු දා සිට උන් වහන්සේගේ අවසාන කාලය දක්වා මට ඉඩ ඇති වූ හැම විටක ම පාහේ උන් වහන්සේ හමුවීමට යාම මගේ සිරිත විය. විශ්ව විද්‍යාලය කොළඹින් බැහැර ගෙන යාමෙන් මට සිදු වූ නොයෙක් අඩුපාඩු අතුරින් උන් වහන්සේ සමඟ සාකච්ඡා කිරීමට ඇති අවස්ථාවන් මඳ වීම ප්‍රධාන ගණයෙහි ලා සැලකීමි. උන් වහන්සේගෙන් මා ඉගෙන ගත් දේ බොහෝ ය ( ශ්‍රී වජ්‍රඥාන සාහිත්‍යය).

එසේ ම 1950 දශකයේ දී පැළෑණේ හිමියන් හමු වී 'දහම් ගැට මාලාව' නම් ප්‍රහේලිකා කාව්‍යය පිළිබඳව සිදු කළ දහම් සැසඳිලි පිළිබඳව මපියාණන් වූ සඳදස් කෝපරහේවා සූරීන් ද නොයෙක් විට අප වෙත තොරතුරු හෙළි කර ඇත. බුදුනුවන් පමණක් නොව කිතුනුවන් පවා පැළෑණේ මහ නා හිමියන් වෙතින් භාෂා සාහිත්‍ය විෂයක ගුරුපදේශ ලබා ගෙන ඇති බව එකල සිටි ප්‍රකට ග්‍රන්ථ කර්තෘවරයකු, කවියකු හා ක්‍රිස්තු භක්තිකයකු වූ කටුනායක ලයනල් ඩබ්ලිව්. ද සිල්වා සූරීන් සිය 'වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ' (1948) නම් මාහැඟි ග්‍රන්ථ මාලාවේ ප්‍රථම කාණ්ඩයේ පළ කර ඇති පහත සටහනින් පැහැදිලි වේ.

පොත සකස් කිරීමේ දී යම් යම් ගුරුපදේශ දීමෙන් මහ පෙන්වූ අස්මදාචාර්ය ශ්‍රී ධර්මරක්ෂිත වංශාලංකාර ධර්මකීර්ති ශ්‍රී පැළෑණේ වජ්‍රඥානාභිධාන මාහිමිපාණන්

වහන්සේට හද පත්ලෙන් ම තියු පැසැසුම් පුදමහ. යම්තමකට කවියක් හෝ යම්තමකට ලිපියක් හෝ ගෙතීමට හෝ ගැළැපීමට අපට ශක්තිය ලැබී තිබෙන්නේ ශීලධර වූ ද ධර්මධර වූ ද ශාස්ත්‍රධර වූ ද මොවුන් වහන්සේ නිසා ම බව සැබෑ වූ ගුරු භක්තියෙහි පිහිටා සිටැ මෙහි සඳහන් කෙරෙමින් මැ දැනට ගිලන් වැ වැඩ වසනා අපේ සංඝ පිතෘවරයාණන්ට උභය ලෝකාර්ථ සිද්ධිය පිණිස සුව දිගා සිරි ම පතම්හ ( iv පිටුව).

නූතන යුගයේ ලොවට දහම් දැනුම බෙදා ලූ බෞද්ධ විශ්වවිද්‍යාලයක් යැයි කිව හැකි වජිරාරාමය මුල් කර ගෙන සිදු වූ ධර්ම ශාස්ත්‍රීයල ආගමික හා සමාජීය සේවාව ඉමහත් ය. පැළෑණේ සිරි වජිරඤාණ හිමිපාණන්ගේ අපවත් වීමෙන් පසු 1955 දී වජිරාරාමයේ අධිපති ධුරයට පත් වූ නාරද හිමියෝ, ලොව පුරා ධර්ම දූත සේවාවේ නිරත වෙමින් ද සිංහල - ඉංග්‍රීසි දෙබසින් ම ධර්ම ග්‍රන්ථ රචනා කිරීමෙන් මහත් මෙහෙවරක් ඉටු කළහ. පැළැණේ මහ නා හිමියන්ගේ කීර්තිමත් ශිෂ්‍යයෙකු වූ පියදස්සී හිමියෝ ද දහම් පතපොත ලිවීමෙන් හා ධර්ම ප්‍රචාරයේ යෙදෙමින් වජිරාරාම නාමය ලොව පුරා පතළ කළහ.

1983 දී පූජ්‍ය නාරද හිමිපාණන්ගේ අපවත්වීමෙන් පසුව වජිරාරාමයේ අධිපති පදවියට පත් මඩිහේ පඤ්ඤාසීහ මහ නා හිමියෝ ලංකාවේ මෑත ඉතිහාසයේ සිටි විශිෂ්ටතම සංඝ පිතෘවරයාණ කෙනෙකි. පැළෑණේ හිමියන්ගෙන් පසුව ස්වනිකාය වූ අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ මහානායක පදවියට පත් උන් වහන්සේ වජිරාරාම සම්ප්‍රදායට අනුව දේශපාලන කටයුතුවලින් ඈත්ව බස - රැස - දෙස හා සසුන වෙනුවෙන් මැදිහත් වෙමින් රට පුරා සාමයික හා සමාජීය කටයුතු රැසක් ආරම්භ කිරීමට පුරෝගාමී වූහ.

මෙලෙසින් සියවසකට වැඩි කාලයක් මුළුල්ලේ සම්බුද්ධ ශාසනයේ පමණක් නොව මෙරට සමාජ සංස්කෘතික හා ධර්ම ශාස්ත්‍රීය අභිවෘද්ධිය උදෙසා ඇප කැප වූ භික්ෂු පරපුරක උදාර මෙහෙවර සිහි ගන්වන සිරි වජිරාරාමය, වත්මනෙහි අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ මහානායක තිරිකුණාමලයේ ආනන්ද මහ නා හිමිපාණන්ගේ නායකත්වයෙන් සමස්ත භික්ෂු පරපුරට ම පූර්වාදර්ශයක් සපයන අගනුවර පිහිටි පූජා භූමියකි.

## ආශ්‍රිත පතපොත


කරුණාරත්න, ඩේවිඩ්. ශ්‍රී වජ්‍රඥාන චරිතය කොළඹ : ආට් ප්‍රින්ටර්ස්, 1955.

ද සිල්වා, කටුනායක ලයනල් ඩබ්ලිව්. වර්තමාන සිංහල කවීන්ද්‍රයෝ ප්‍රථම කාණ්ඩය කොළඹ: පෙරමුණ මුද්‍රණාලය, 1948.

නාරද මා හිමි. ධර්ම සංග්‍රහය [ 12 වන සංස්කරණය ] කොළඹ: ලේක්හවුස්, 1974.

පඤ්ඤාසීහ හිමි, මඩිහේ (සංස්කාරක) ශ්‍රී වජ්‍රඥාන සාහිත්‍යය - 1 කොළඹ: ස්වභාෂා මුද්‍රණාලය, 1967.

වජ්‍ර ප්‍රභා - සිරි වජිරාරාම දහම් පාසලේ සියවසක මෙහෙවර 1918 – 2018

**වික්‍රමසිංහ, මාර්ටින්. අපේ උරුමය හා භික්ෂූන් වහන්සේ දෙහිවල: තිසර ප්‍රකාශකයෝ, 1998.**

**බෞද්ධ ළමයා - සදහම් සඟරාව 1936, 1944**